www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රිඩ්ලි ස්කොට්ගේ රොබින් හුඩ්: ධනවතුන්ට පවා ආදරය කළහැකි නීතිය නොතැකූ වීරයෙක්

**Ridley Scott's *Robin Hood*: an outlaw hero that even the rich can love**

කෙවින් කියර්නි විසිනි

2010 ජුනි 09


රොබින් හුඩ්හි රගන රසල් ක්‍රෝ සහ කේට් බ්ලැන්චට්

රොබින් හුඩ්ගේ කතාව ඉංග්‍රීසි කතාකරන සංස්කෘතික සම්ප්‍රදායේ එන මිථ්‍යා කථාවලින් වඩාත් ම ආදරයට පාත්‍ර වූ එකකි. ධනවතුන්ගේ සහ වරප්‍රසාදිතයන්ගේ ව්‍යාජ අධිකාරීත්වයට විරෝධය දක්වන සහ සූරාකැවෙන්නවුන්ගේ සහයෝගිතාව මූර්තිමත් කරන මෙම චරිතය මධ්‍යකාලීන යුගයට අයත් අනේක ඉංග්‍රීසි ග්‍රන්ථ, නාට්‍ය සහ චිත්‍රපට මගින් අප වෙත සම්ප්‍රේෂනය කරනු ලැබ ඇත.

හොඳට හෝ නරකට මෙම ක්‍රියාදාමය කාලීන සමාජ, ආර්ථික සහ දෘෂ්ටිවාදාත්මක පීඩනයන් මත යැපෙමින් රොබින් හුඩ් කතාව ගතත් නැති වෙනස්කම්වලට ස්වාභාවිකව ලක් කොට ඇත. එසේ වුවත් මෙම කතාව සමාජය, නීතිය සහ සදාචාරයේ පන්ති ස්වභාවය පිලිබඳ සමහර සාරාත්මක සත්‍යයන් නිරූපනය කරනතාක් දුරට මහජන විඥානය තුල රැඳී පවතී.

රිඩ්ලි ස්කොට් සහ තිරකතා රචක බ්‍රයන් හෙගලන්ඩ් රොබින් හුඩ් පුරාවෘතයේ නව සංස්කරනය තුල චරිතයේ සියලු සාරාත්මක අන්තර්ගතය සන්තෘෂ්ටියෙන් යුතුව ඉවත් කරන්නේ ඔවුන්ගේ ම අප්‍රසන්න ප්‍රබන්ධයන්ගෙන් පුරවාලූ වියලි කටුවක් ඉතිරි කරමිනි. සාරාංශගත කරතොත් අප සියලු දෙනා දන්නා සහ ආදරය කරන ශ්‍රේෂ්ට කතාවට පෙර එන රොබින් හුඩ්ගේ ජීවිතයට නව පරිච්ඡේදයක් එක් කිරීමට ඔවුහු කතාව සංශෝධනය කරති - නැතහොත් හොලිවුඩ් භාෂාවෙන් ඔවුහු "වාර්තා බිඳිනයක්" නිපදවා ඇත.

මෙම නව පරිච්ඡේදය කිසිසේත් වික්‍රමාන්විත නොවන කනස්සල්ලෙන් පසුවන රොබින් (රසල් ක්‍රෝ) කෙනෙක්, එනම් කිසිසේත් නීතියට පරිබාහිර නොවන, මාරාවේශී ප්‍රන්ස සදාකාලික සතුරාට එරෙහිව තම රට, එනම් සූරාකන්නන් මෙන් ම සූරාකැවෙන්නන් ද, එක්සත් කිරීම උදෙසා දූෂිත සහ අනුකම්පා විරහිත රජෙකුට උදවු කරන විශිෂ්ට දේශප්‍රේමියෙක්, ඉදිරිපත් කරයි. තවත් නව එකතුකිරීමක් වන්නේ රොබින් හුඩ් සහ ඔහුගේ ප්‍රීතිමත් මිනිස්සු ආරම්භයේදී මුනගැසී

වෙලෙන්ඳන් ලෙස එකට බැඳී කුරුස යුද්ධවල දී මුස්ලිම්වරුන් සමූල ඝාතනය කිරීම යි!

අහිංසක මුස්ලිම් ගැහැනුන් සහ ලමුන් මරාදැමීමට රජතුමා දෙන නියෝග ක්‍රියාවේ යෙදවීම පිලිබඳව ස්කොට්ගේ රොබින් හුඩ්ගෙන් සීමිත පසුතැවිල්ලක් පවා ප්‍රකාශ වන්නේ කුරුස යුද්ධ පිලිබඳව තම අවංක අදහස පැවසීමට රජු විසින් බලපෑම් කිරීමෙන් අනතුරුවයි. එය ඔහුට එතරම් ගැඹුරින් බලපා නැති අතර ඔහුගේ ප්‍රීතිමත් මිතුරන්ට බලපා ඇත්තේ ඊටත් අඩුවෙනි. මෙම පසුව සඳහන් කල තැනැත්තෝ බීමට සහ ගැහැනුන් හඹායාමට ප්‍රියකරන ගොරහැඩි විනෝදකාමී කොල්ලන් රොත්තක් ලෙස පුනර්භවනය කරනු ලැබේ.

චිත්‍රපටයේ මෙම විකාර රූපී භාවය තුල ප්‍රකාශයට පත්වන දෘෂ්ටිවාදාත්මක පීඩනයන්ගේ ගැඹුර මැනීමට මෙහි දී යමෙක් අදහස් නො කරන බව කීම අනවශ්‍ය ය. ඔවුන් බහුල වසයෙන් ඔවුන් වෙනුවෙන් ම කතා කරන අතර ඔවුන් කියන දේවල් ස්කොට් හෝ හෙගලන්ඩ්ට චාටු බස් (ද *ග්‍රීන් සෝන්, මිස්ටික් රිවර්* ආදිය) නො වේ. ඒ වෙනුවට අපි මර්දනය කර ඇත්තේ කුමක්දැ යි විමසමු. පැරැනි සම්ප්‍රදාය සංශෝධනය කරමින් රිඩ්ලි ස්කොට් විසින් කරන ලද නව නිර්මානය මගින් යමෙකු තුල ප්‍රතික්‍රියා දනවන රොබින් හුඩ් කතාවේ වඩාත් විශේෂිත සහ නො නස්නා දේ කුමක් ද? එය හුදෙක් මනෝගතියක් ද නැතහොත් එහි යම් ගැඹුරු දෙයක් තිබේ ද?

ස්ටීවන් නයිට් සිය "රොබින් හුඩ්ඃ ඉංග්‍රීසි නීති විරෝධියා පිලිබඳ පූර්න අධ්‍යයනයක්" යන කෘතිය තුල ශතවර්ෂ ගනනක් පුරා රොබින් හුඩ් පිලිබඳ විවිධ ප්‍රකාශන සැලකිල්ලෙන් වාර්තා ගත කරයි. කලහකාරී එහෙත් තරමක් දුරට හිංසාකාරී සහ ගුප්ත චරිතයක් ලෙස 12වන සහ 13වන ශතවර්ෂවල දී රොබින් හුඩ් අවිනිශ්චිත වනාන්තර පලායන්නෙක් වසයෙන් ඇරඹුනු බව ඔහු සටහන් කරයි. එහෙත් 14වන ශතවර්ෂයේ පටන් කාව්‍ය කතන්දර සහ නාට්‍ය තුල රොබින් හුඩ් කතාවේ ජනප්‍රියත්වය ඉහල ගිය අතර එහි අන්තර්ගතය තුල ව්‍යාජ අධිකාරීත්වයට එරෙහි ප්‍රතිරෝධයේ සහ ප්‍රජා සහෝදරත්වයේ මූලිකාංග වඩා නිශ්චිත බවට පැමිනුනි.

1500 ගනන්වල රොබින් හුඩ් නාට්‍යවල සංඛ්‍යාතය අනවරතව ඉහල ගිය අතර එයට සමගාමීව වෙන කවරදාටත් වඩා නිල අවධානයද ඉහල ගිය බැව් නයිට් සඳහන් කරයි. මෙම කාලපරිච්ඡේදයේ දී නාට්‍යය සහ අනෙකුත් ජනප්‍රිය උත්සවශ්‍රීයයන් කැරලිකාරී ලෙස සැලකූ අතර ඒවා මහජන කැරලි සමග සහයෝගී වෙතැයි සලකා බොහෝ අවස්ථාවල දී තහනමට ලක්කරනු ලැබිනි. 17වන ශතවර්ෂය මැදභාගයේ ඉංග්‍රීසි සිවිල් යුද්ධයට පෙරාතු කාලයේ ඒවා බොහෝකොට විනාශ කරනු ලැබිනි.

එහෙත් රොබින් හුඩ් කතාව හුදෙක් මහජන පරිකල්පනයෙන් සමස්තයක් ලෙස පැන නැගුනා නොවේ. එයට පශ්චාත් මධ්‍යකාලීන එංගලන්තයේ සමාජ-ආර්ථික ගැටුම් තුල නිශ්චිත මූලයන් පැවතුනි. කාල් මාක්ස් තම *ප්‍රාග්ධනය* කෘතියේ දී "ප්‍රාග්ධනයේ ප්‍රාථමික සමුච්ඡය වීම" හෝ ධනවාදයේ පෙරඉතිහාසය යයි සඳහන් කරන දෙය තුල එංගලන්තයේ මෙම කාලපරිච්ඡේදය විශ්ලේෂනය කරයි. මාක්ස් කියන පරිදි "දේශපාලන ආර්ථිකය තුල ප්‍රාථමික සමුච්ඡය වීම ඉටුකරන්නේ දේවධර්මය තුල මූලික පාපය ඉටුකරන ක්‍රියාකලාපය මැ යි."

සමාජ-ආර්ථික ආස්ථානයකින් ගත්කල මෙය වනාහි ගොවිදාසයා ඉඩම් හිමියෙකුට බැඳී සිටි වැඩවසම් ක්‍රමයේ පරිවර්තනයක් ඇති වූ කාලපරිච්ඡේදය යි. වැඩවසම් ක්‍රමය තුල ශත වර්ෂ ගනනාවක් තිස්සේ ගොවිදාසයාට තමා සතු කුඩා උපකරන සහ ඉඩම් කට්ටිය සිය ඊලඟ පරම්පරාවට දායාද කෙරීමේ හිමිකම පැවතින. ගොවිශ්‍රමිකයාට සිය පුද්ගලික උපකරන සහ කුඩා ඉඩම් කට්ටිය අහිමි කලාවූද ඉඩම් හිමියාට තිබූ බැඳීම් අහිමිකලාවූ ද නව සමාජ ක්‍රියාවලියක් වැඩවසම් බන්ධන බිඳ දමමින් පැරනි සමාජ දේහයේ ගර්භාෂය තුල වැඩෙන්නට විය. පුද්ගලික ව්‍යාවසායකයිනට හිමි කාර්මික ප්‍රමානයේ උපකරන මගින් ක්‍රියාවේ යොදවනු ලබන්නාවූද ශ්‍රමය සමාජ ක්‍රියාවලියක් බවට පත්කලාවූ ද වූ සුවිසල් ධනේශ්වර ව්‍යවසායන් තුලට ගොවි ශ්‍රමිකයා ඇද ගනු ලැබින.

මෙය වනාහි ප්‍රථම වතාවට රොබින් හුඩ් එතරම් ජනප්‍රියත්වයට පත් පශ්චාත් මධ්‍යකාලීන එංගලන්තයේ ජන සමූහයා විසින් අත්දකින ලද කෲර ක්‍රියාදාමයකි. මාක්ස් මෙම යුගයේ පාර්ශ්ව දෙක පිලිබඳව සඳහන් කලේ යඃ "නිෂ්පාදකයින් වැටුප් ශ්‍රමිකයන් බවට පරිවර්තනය කරන ඓතිහාසික චලනය එක් අතකින් ඔවුන්ව වැඩවසම් බන්ධනයෙන් සහ ශ්‍රෙනි සමාජයේ විලංගුවලින් මුදාලන බවක් පෙනෙන අතර අපගේ

ධනේශ්වර ඉතිහාසඥයින්ට පෙනෙන්නේ මේ අංශය පමනි. එහෙත් අනෙක් අතට ඔවුන්ගේ ම නිෂ්පාදන මාධ්‍ය සියල්ලක් ම සහ වැඩවසම් සැලසුම් මගින් දරා සිටියා වූ පැවැත්මේ සියලු සහතික වීම් ඔවුන්ගෙන් සොරාගනු ලැබීමෙන් පසුව පමනක් මෙම නව නිදහස් මිනිස්සු තමන්ව ම විකුනන්නන් බවට පත් වේ. මෙහි ද ඔවුන්ගේ හිමිකම් පවරාගැනීමේ ද ඉතිහාසය මානව වර්ගයාගේ ඓතිහාසික සටහන්වල ලෙයින් සහ ගින්දරෙන් ලියැවී ඇත."

මහජනයා නගරවාසීන්, පාදඩයින් සහ රස්තියාදුකාරයින් බවට අවසානයේ පත්වීමට සිය ඉඩම්වලින් ඇද දැමූ මෙම කාලපරිච්ඡේදය තුල ඔවුන් පිලිබඳව රොබින් හුඩ් සම්ප්‍රදාය සමග එකපෙලට සිටින බොහෝ වික්‍රමාන්විත කතා කියනු ලැබ තිබේ. මෙම ක්‍රියාදාමයට සමගාමීව විරෝධය පලකලවුන්ව හිරගත කිරීම, වධබන්ධනවලට ලක්කිරීම සහ මරාදැමීමට අවශ්‍ය නීති සම්පාදනය කෙරින. වැටුප් අවම මට්ටමේ ද වැඩකරන පැය ගනන උපරිම මට්ටමේ ද තබමින් කම්කරු සංවිධාන ඇතිවීම වලක්වන නීති ද මේ සමගම සම්පාදනය විය. තව ද මෙම කාලපරිච්ඡේදය රාජධානියෙහි සියලු වැසියන් විසින් පොදුවේ පරිහරනය කල ස්වභාව ධර්මයට අතහැර තිබුනු "පොදුබිම්" විනාශ කිරීම ද සිදු විය. නැවුම් වනාන්තරවල මෙම මාර්ග රොබින් හුඩ් කතාවල එන "හරිත වනයන්"ගේ පැහැදිලි පදනම වූ අතර රොබින් සහ ඔහුගේ මිත්‍රයන් නර්තනයේ යෙදෙන ස්ථාන බවට පත්විය.

රොබින් හුඩ් ගත්කල අවසානයේ සිය මූලයන් ඇමරිකාවේ සහ ඕස්ට්‍රේලියාවේ ඉංග්‍රීසි යටත් විජිතවල සොයාගත්, 1800 ගනන්වල පසුභාගය වනතෙක් ක්‍රියාවේ යෙදවූ අසාධාරන ලෙස පීඩාකාරී පන්ති විඥාත නීති විරෝධීත්වය සැමරීමේ සංසකෘතික සම්ප්‍රදායේ ප්‍රථම සහ මූලාකෘතික රූපාකාරය වීම නිසා විශේෂිත වේ. මේ සම්ප්‍රදායේ කිහිප දෙනෙක් පමනක් නම් කරතොත් "රොබින් හුඩ්" වරයෙක්ගේ නීතිගරුක ප්‍රභාව සිය සජීවී මිනිසුන් වන ඕස්ට්‍රේලියාවේ නෙඩ් කෙලි සහ තවමත් විවාදයට ලක්වන කැලිෆෝනියාවේ ජෝකින් මුරියේටා තමන් කරා ඇඳ ගත්තේ ය. 1919 පලකල ජොන්ස්ටන් මැක්කලිගේ "ද කර්ස් ඔෆ් කැපිස්ට්‍රානෝ (කැපිස්ට්‍රානෝගේ සාපය)" කතාවේ "සෝරෝ" නමැති ප්‍රබන්ධ චරිතයට බලපෑවේ මුරියේටා යයි පුලුල්ව පිලිගැනේ.

අවසාන වශයෙන් රොබින් හුඩ් ද නීතිය නොතකන්නන් පිලිබඳව ඉන්පසුව පැමිනි ශ්‍රේෂ්ට කතා ද ධනපති පාලක පන්තියේ අධිකාරයට සහ සූරාකෑමට එරෙහි නවීන අරගලයට පෙර පැමිනෙන සහ සමහර අංශවලින් එය පූර්වාපේක්ෂා කරන ඇල්මෙන් රැක බලාගන්නා සංස්කෘතික ධාතු වස්තු බවට පත්ව ඇත. ඒවා පන්ති සමාජයේ ඉතිහාසය පුරා පැවතී ඇත්තා වූ ද අද දක්වා ම සිදුවෙන්නා වූ ද සූරාකෑමෙන් විමුක්තිය ලැබීම සඳහා මසින් සහ ලෙයින් කරන අරගලයේ පූර්ව පරිච්ඡේද පිලිබඳ කුඩා කලාත්මක පිලිබිඹුවකි.

මනෝගතිය හෝ සම්ප්‍රදායිකත්වය නිසා නොව මෙන්න මේ නිසා විශේෂයෙන් ම වත්මන් කාලපරිච්ඡේදයේ ස්කොට්ගේ සංශෝධනවාදී චිත්‍රපටය එතරම් මැ පිලිකුල් සහ ඇල්මැරුනු එකක් වේ.

චිත්‍රපටය, කලාව සහ කතා ඉදිරිපත් කිරීම තුල පර්යේෂනයන් කිරීම පිලිබඳව කිසිවෙක් ස්කොට් හෝ ඔහුගේ තිරකතා රචකයන්ව තාඩනයට ලක් නො කරයි. එහෙත් මෙහි දී ස්කොට් කරන්නේ එය නො වේ. නව පරම්පරාවකට අතීත හෝ වර්තමාන කාලපරිච්ඡේදය වඩා හොඳින් අවබෝධ කරගැනීමට උදවු වනු ඇත්තා වූ රොබින් හුඩ් කතාවේ ගැඹුරු සත්‍යයන් සොයා යාමක් ඔහු නිර්මානශීලීව නො කරයි. වඩාත් මූලික මට්ටමෙන් ගත්කල චිත්‍රපටය විනෝදජනක නො වේ. ඔහුවැනි චිත්‍රපටකරුවෙක් සතුව තිබෙන යෝධ මුදල් ප්‍රමානයට ලාක්ෂනික වන ඔපදැමූ ගුනයක් එයට තිබෙනමුත් එය දිගු (විනාඩි 140ක්) සහ වෙහෙසකාරී වේ. රචනය ඉතා නරක වන අතර චරිත ගොඩනැගීම සාමාන්‍ය ක්‍රියාදාම චිත්‍රපටයක විස්තර කෙරෙන සහ වෙනස් කෙරෙන ආකාරයේ වෙද්දී රොබින් හුඩ් සමහර දේශපාලනික මනෝගතීන් ප්‍රකාශ කරන කෙටි මොහොතවල් රේඩියෝ වැඩසටහනක් මෙහෙයවන්නා උස්හඬින් කතාකිරීම මෙන් පුරෝකථනය කල හැකි මෙන් ම නිවට ය.

අප වෙත ඒලියන් (පිටස්තරයා) සහ බ්ලේඩ් රන්ර නමැති විශිෂ්ට විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපටය ගෙන ආ මිනිසා මෙහි පෙනී නො සිටී. මෙය ගාම්භීර කලාව හෝ ගාම්භීර ඉතිහාසය නො වේ. රොබින් හුඩ්ගේ කර අඹන රිඩ්ලි ස්කොට් ඔහුව ඔහුගේ ප්‍රතිවිරුද්ධය බවට හරවයි. මෙය තනි සිද්ධියක් නො වේ. පසුගිය දශකය හෝ ඒ ආසන්න කාලය පුරා මෙම චිත්‍රපටකරුවා තමන්ගේ ම සිනමාත්මක ඓතිහාසික මුසාකරනය පිලිබඳ තමාගේම අසතුටුදායක සලකුනක් වර්ධනය කරමින් සිටින බව

පෙනේ. හොලිවුඩ් පන්නයේ ඉතිහාසයේ සහ අර්ධ-දක්ෂිනාංශික ජනතාවාදයේ භාෂාවෙන් "සාමාන්‍ය ජෝසෆ්ගේ" අතෘප්තියට ආමන්ත්‍රනය කිරීමට චිත්‍රපටය උත්සාහ දරන බව පෙනෙන්නේ රිඩ්ලි ස්කොට් තැනූ රසල් ක්‍රෝ රඟන තවත් චිත්‍රපටයක් වන *ග්ලැඩියේටර්* හි උත්සාහ කල පරිද්දෙන් ම ය.

*ග්ලැඩියේටර්* සහ *රොබින් හුඩ්* යන චිත්‍රපට දෙකෙහිම ප්‍රේක්ෂකයා සහ ඔහුගේ හෝ ඇයගේ හැඟීම් අතිශයින් අපරූපී කරන ලද අතීතයට අයත් යුගයකට - මෙහි ඇඳුම්, මිනිසුන්ගේ නම්, ස්ථාන සහ දේවල් මූලික වසයෙන් නිවැරදි ය - ප්‍රවාහනය කිරීමේ ප්‍රවනතාව දරා සිටින්නේ ඔහු හෝ ඇය විඳවන දේවල් අලුත් නො වේ ය, සහස්‍රයක් හෝ දෙකක් පුරා කිසිවක් වෙනස් වී නැති ය, කිසිවක් කිසිදා වෙනස් වන්නේ ද නැත යන අදහස දිරිමත් කිරීමට ය. රෝම කාලපරිච්ඡේදයේ පටන් මධ්‍යකාලීන එංගලන්තයේ සිට වර්තමානය දක්වා මිනිසාට සූරාකෑම උපේක්ෂාවෙන් දරාසිටීමටත් මෝඩයන් සහ කපටීන් විසින් වටකරනු ලැබ (ඔහු ප්‍රවන්ඩව පුපුරා යනතෙක්) දූෂනය වීමටත් සිදු වී තිබේ.

සදාචාරය වන්නේ: යමෙක් ඔහුගේ හෝ ඇයගේ හිස කෙලින් තබාගෙන සිටී ද; නැතහොත් ඔහුගේ හෝ ඇයගේ ඉරනම නිහතමානීව දරා සිටිමින් රාජ්‍යයට... රජුට...ජාතික ආන්ඩුවට විශ්වාසවන්තව සිටී ද එවිට ප්‍රතිඵලය සන්තෘෂ්ටිදායක ය. සාරාංශ වසයෙන් කියතොත් මේවා ඇති පදමින් අනුකූලවාදී වල්පල් ය.

යුග ගනන් පුරා රොබින් හුඩ්ගේ සාරයට සත්‍යවාචී වී ඇති නිර්භීත කලාකරුවන්ට තෙවරක් සච්දිය! මෙම සංස්කරනය හෙලා දකිනු!

© www.wsws.org